**ඇලෙයිනා බී. ටෙප්ලිට්ස් තානාපතිතුමිය 2021 අගෝස්තු 19**
**ඩේලි මිරර් පුවත්පත සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව**

**ප්‍රශ්නය:** මෑතකදී ඔබ මාධ්‍යවේදීන් හමුවූ අවස්ථාවේ වරාය නගර නීතිය ගැන සඳහන් කරමින් මුදල් විශුද්ධිකරණයට සඳහා යොදාගන්නට විවෘත තැන් එහි තිබෙන බව පැවසුවා. ඇත්තෙන්ම,මේ නීතියේ ඔබ බැලූ විශේෂිත අංග මොනවාද?

**ටෙප්ලිට්ස් තානාපතිතුමිය:** ඔබ දන්නවා, වරාය නගරය සම්බන්ධයෙන් එහිදී අප මාධ්‍යවේදීන් සමග කළේ පුළුල් සාකච්ඡාවක්, එහිදී අපි පැහැදිලිවම කථා කළේ වරාය නගරයෙන් ද ඉදිරියට ඇතිවීමට ඉඩ ඇති දෙයක් සම්බන්ධයෙන්. වරාය නගරය තුළින් තමන්ට ලැබී ඇති ආයෝජනවලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට ශ්‍රී ලංකා රජයට වුවමනා බව මා පිළිගන්නවා, මා සඳහන් කළේ, වරාය නගරයට ආයෝජන ආකර්ෂණය කරගැනීමට වඩාත්ම සුදුසු ව්‍යාපාර පරිසරයක් රජය විසින් නිර්මාණය කිරීමට සැලකිලිමත් වියයුතු බවත්, නීති සම්පාදනය හෝ රෙගුලාසි ක්‍රියාවට නැංවීම තුළ එම රෙගුලාසි ඉහළම ජාත්‍යන්තර ප්‍රමිතිය සපුරා නැතිනම් ඇතිවිය හැකි දුර්වල ක්‍රියාමාර්ග හෝ, මුදල් විශුද්ධිකරණය, දූෂණය හා වෙනත් දෑ වැනි නීතිවිරෝධී මූල්‍යකරණ කටයුතු ඇතිවීමට දොරටු විවෘත කර නොතැබෙන බවට සුපරික්ෂාකාරී වියයුතු බවයි.

ඒ ආකාරයේ ක්‍රියාමාර්ගවලට තමන් නිරාවරණය නොවෙන බවට සහතික කිරීමක් ව්‍යාපාර ඉල්ලා සිටින්නට හැකියි, නිසැකවම ඇමරිකානු සමාගම්වලට දූෂිත ක්‍රියාමාර්ගවල නිරතවීම නීතියෙන් තහනම් වී ඇති නිසා ව්‍යාපාර පරිසරය හැකිතාක් දුරකට සුපවිත්‍ර නැතිනම් ඔවුන් ඒ ගැන විශේෂයෙන් පරික්ෂාකාරී වේවි.

ඒනිසා, රජය සුපරික්ෂාකාරීව සිටිය යුත්තේ මේවාගේ දේවල් සම්බන්ධයෙන් ය කියා මා සිතනවා, මේවා ප්‍රශ්නකාරී නොවන බවත්, නුසුදුසු වියහැකි එවැනි පරිසරයකට ව්‍යාපාර නිරාවරණය නොවන බවත් සහතික කරගන්නට ක්‍රියාකළ යුතුයි.

ආරම්භයේ දී ම සූදානම්වීම ඉතාමත් වැදගත් වෙනවා. නීති සහ රෙගුලාසි ඉහළම ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කරගතයුතු වෙනවා.

**ප්‍රශ්නය:** මේ කළාපයේ කේන්ද්‍රයක් ලෙස සහ දකුණු ආසියාවට ප්‍රවේශ දොරටුවක් ලෙස ක්‍රියාත්මකවීමට තමන් උත්සාහ කරන බව ශ්‍රී ලංකාව කියා සිටිනවා. මේ කටයුත්තට සහභාගිවීම සඳහා එක්සත් ජනපදය කොයිතරම් උනන්දු ද?

**ටෙප්ලිට්ස් තානාපතිතුමිය:** ශ්‍රී ලංකාව කියන්නේ අතිමහත් වාණිජ සහ ආර්ථික විභවයක් ඇති ස්ථානයක් බවත් වරාය මෙහයවීම සහ කටයුතු සංවිධාන මෙහෙයුම් සඳහා සම්බන්ධවීම අතින් ශ්‍රී ලංකාවට සෑහෙන අත්දැකීම් ප්‍රමාණයක් තිබෙන බවත් මා මුලින්ම කියනවා. මා සිතන විදියට, මේ විභවය තවදුරටත් පුළුල් කරගෙන තවතවත් සාර්ථකවීම, හෝ තිරසාර සාර්ථකත්වයක් ලබාගැනීම සඳහා ආයෝජකයින්ට ආකර්ෂණශීලී, විනිවිදභාවයෙන් යුත් ආර්ථික පරිසරයක් තිබීම මෙහිදීත් ප්‍රධානම කාරණය වෙනවා.

ආර්ථික වශයෙන් ශක්තිමත් ශ්‍රී ලංකාවක් කියන්නේ අප දෙරටටම උනන්දුවන කාරණා සඳහා හොඳ දෙයක්. එක්සත් ජනපදයේ අපි, ශ්‍රී ලංකාවේ තිරසාර ආර්ථික වර්ධනයක් පෝෂණය කිරීම සඳහා කාලයක සිට කැපවෙමින් ජාත්‍යන්තර යහපරිචවලට අනුකූල වන අන්දමින් මූල්‍ය ආයතන සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරය සඳහා ශ්‍රී ලංකාවට හැකියාව ලැබෙන ප්‍රතිපත්ති පැනවීමට අපි රජය දිරිගන්වා තිබෙනවා. ප්‍රවේශ දොරටුවක් හා කේන්ද්‍රයක් විදියට ශ්‍රී ලංකාවට ආයෝජන ආකර්ෂණය කරගැනීමට හැකි වඩාත්ම සුදුසු තත්වයකට යා හැක්කේ ඒ ආකාරයටයි.

**ප්‍රශ්නය:** කලින් කී මාධ්‍ය සාකච්ඡාවේදීම ඔබ කියා සිටියේ එක්සත් ජනපදයේ ව්‍යාපාර කටයුතු දූෂිත ක්‍රියාමාර්ග ඇති තැන්වල සිදුවන්නේ නැති බවයි. ඔබ මෙය සඳහන් කළේ නිව් ෆෝට්‍රස් එනර්ජි සමාගමෙන් යෝජිත ආයෝජනය ගැන ප්‍රශනයකට පිළිතුරු දෙමින්. තානාපතිතුමියනි, ඔබේ අදහසේ හැටියට ශ්‍රී ලංකාවේ මේ ප්‍රශ්නය කොයිතරම් බරපතළ ද?

**ටෙප්ලිට්ස් තානාපතිතුමිය:** ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය 2020 නිකුත්කළ දූෂණය සංජානන දර්ශකයට අනුව රටවල් 179ක් අතරින් ශ්‍රී ලංකාව 94වැනි ස්ථානයේ ශ්‍රේණිගත වී තිබෙනවා. පැහැදිලිවම, මෙය වැඩිදියුණු කරගැනීමට ඉඩ පවතිනවා. ඉන්දියාව ඇත්තේ 86 වැනි ස්ථානයේ. රුවන්ඩාව 49 වැනි ස්ථානයේ. සිංගප්පූරුව 3 වැනි ස්ථානයේ. මේ තරඟකරුවන් සහ අසල්වාසීන් සමගින් සම මට්ටමකට යෑමට ශ්‍රී ලංකාවට සෑහෙන අවස්ථා තිබෙනවා. රජය යම් පරිසරයක් දෙස බලනවිට, එය පැහැදිලිවම එම පරිසරයේ දූෂණය සඳහා ඇති අවදානමේ තරම සලකා බලනවා- දූෂණය සඳහා ඇති ඉඩ එම අවදානම් ගණනය කිරීමේ කොටසක් වෙනවා. යම්කිසි ආර්ථිකයක් ශක්තිමත් කරගන්නට කළයුතු සෑම දෙයක්ම එම ආර්ථිකයේ දූෂණය අඩු කරගැනිමට යොදාගත හැකියි. සම්පාදනය කරන නීති ඉහළම ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලන බව සහ ඒවා සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කෙරෙන බව සහතික කරගැනීම, ගිවිසුම් බලාත්මක කෙරෙන බවත් අතරමගදී අල්ලස් හෝ ගාස්තු ඉල්ලීම් හෝ අයුතු ලාභ හෝ වෙනයම් දෙයක් ඉල්ලා සිටීම සඳහා අවස්ථා නොමැති වන ආකාරයෙන් කාර්යපටිපාටීන් හැකිතරම් සුමට සහ කාර්යක්ෂම වන බවත් සහතික කරගැනීම වැනි දෑ ඊට ඇතුළත් වෙනවා.
වාණිජ නීතිය එකම ආකාරයෙන් අදාළ කරගැනීම තුළ ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපරවලට වර්ධනය වියහැකි පරිසරයක් නිර්මාණය කරගත හැකියි කියා මා සිතනවා. ඒවාට ජාත්‍යන්තර හවුල්කාරීත්ව සඳහා සම්බන්ධවන්නට හෝ තමන්ගේ දේශීය ආර්ථිකය තුළ වර්ධනය වන්නට හැකියි. මෙය විදේශ ආයෝජන සම්බන්ධ කාරණයක් විතරක් නොවෙයි, එය ශ්‍රී ලංකාවේ ව්‍යාපරවලටත් ලැබිය හැකි හොඳම අවස්ථා ලබාගතහැකිවීම සම්බන්ධ කාරණයක්. ඒ ඇතැම් දේවල් දූෂණය පැරදවීමෙන් ළඟා කරගන්න පුළුවන්.

**ප්‍රශ්නය:** (නොපැහැදිලිය) එක්සත් ජනපදයෙන් ආයෝජන සහ ව්‍යාපාර ආකර්ෂණය කරගන්නට ශ්‍රී ලංකාවට වැඩිදියුණු කරගතහැකි විශේෂ අංශ මොනවාද?

**ටෙප්ලිට්ස් තානාපතිතුමිය:** ව්‍යාපාර කිරීමේ පහසුව යන කාරණය ආමන්ත්‍රණය කරන්නට ශ්‍රී ලංකා රජය අගයකළයුතු ලෙස උනන්දු වී තිබෙනවා. ඊට කියන්නේ ලෝක බැංකුවේ ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ දර්ශකය කියායි. දැනට ශ්‍රී ලංකාව රටවල් 190ක් අතරින් 99 වැනි තැන තිබෙනවා. එහෙමනම්, මේ සම්බන්ධයෙන් අපට වැඩිදියුණු වෙන්න පුළුවනි, නේද? ඒ සඳහා බොහෝ අවස්ථා තිබෙනවා. මේ හරහා සාර්ථකත්වයක් ලබන්නට හැකිවේ යැයි මා බලාපොරොත්තු වෙනවා.

ආයෝජකයින්ට ප්‍රධාන වශයෙන්ම වුවමනා කරන්නේ පුරෝකථනය කළහැකිබවයි. ප්‍රතිපත්ති එකකට එකක් ගැලපීම, ආයෝජනවලට වාසිසහගත ප්‍රතිපත්ති, සහ එම ප්‍රතිපත්ති තනි ආණ්ඩුවක ධූරකාලය ඉක්මවමින් පැවතීම ඔවුන් අපේක්ෂා කරනවා. එනිසා දේශපාලඥයින්, රජයේ අනෙක් නායකයින්, කර්මාන්ත නායකයින්, මේ අය එකතුවී ශ්‍රී ලංකාවේ ආර්ථික සහ දේශපාලන අනාගතය ගැන යම් පොදු දැක්මක් පිළිබඳ තනි අදහසකට විත් එය යථාර්ථයක් කරගන්නට එකම ආකාරයෙන් ක්‍රමෝපායක් ක්‍රියාත්මක කළ යුතුයි. එසේ කිරීම පැහැදිලිවම ආයෝජකයින්ට පදනමක් ලෙස යොදාගත හැකි සෞඛ්‍යසම්පන්න ආර්ථික අත්තිවාරමක් සහතික කරනවා.

අවදානම්වලට නිරාවරණය වෙන්නට ආයෝජකයින් අකැමැති බව, වරාය නගරය සහ දූෂණය ගැන අපේ කලින් සාකච්ඡාවට යොමුවෙමින් මා නැවතත් කියන්න කැමතියි. එය, ඔවුන්ගේ ලාභයට බලපානවා පමණක් නොවේ, තමන්ගේ කොටස් හිමිකරුවන්ගේ නියාමන ආයතනවලටත් ඔවුන්ට වගකීමක් තිබෙනවා. ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩල යම් යම් අවදානම් ගැනීමට අකමැති විය හැකියි. යම් යම් ආර්ථික ක්‍රියාමාර්ග පනවනු ලැබීමට ලක්විය හැකි ආයතන වෙත තමන්ගේ සමාගම් නිරාවරණයවීම හෝ ඒවැනි ආයතන සමගින් සහයෝගයෙන් කටයුතු කිරීම සිදු නොවන දැන ගැනීමට ඒ අයට වුවමනායි. ආයෝජනයක් කිරීමට යොමුවෙද්දී එය කලට වේලාවට සහ නොපමාව කරගත හැකි බව දැනගැනීමට ඔවුන්ට අවශ්‍යයි. ඒ සම්බන්ධ ඇතැම් කාරණා අදාළ වන්නේ ගිවිසුම් බලාත්මක කිරීමට. යම් ගිවිසුමක් අත්සන් කළ පසු, එය මේ රටේ බලාත්මක කරගත හැකි බව, බලපත්‍ර, අවසරපත්‍ර ලබාගැනීම හා පරිපාලනමය අනුමැතීන් ලබාගැනීම වැනි කටයුතු නොපමාව, ඒවගේම එකම වහලක් යටින් කරගත හැකි බව මීට ඇතුළත්. නිෂ්පාදන හෝ තමන් කරන කුමන හෝ ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු මේ රටේ ඇතිකරන්නට ඔවුන්ට වුවමනා ඉඩම් හෝ වෙනත් පහසුකම් ලබාගැනීමේ පහසුව ඔවුන්ට වැදගත් වනවා. බිල්පත් ගෙවීමේදී හෝ ලාභ ආපසු සියරට බලා යැවීමට ඔවුන්ට වුවමනා වුනොත් ඒ සඳහා ප්‍රාග්ධන පාලනයක් නොමැති බව දැනගන්නට ඔවුන්ට වුවමනා වේවි. එක්සත් ජනපදයන් සහ තවත් රටවල්වලින් වැඩියෙන් විදේශ ආයෝජන සහතික ලෙසම ආකර්ෂණය කරගැනීමට හැකියාව ලබාදෙන්නේ මෙවැනි දේවල් තුළින්.

ප්‍රශ්නය: ඔබේ අදහසේ හැටියට, එක්සත් ජනපද ව්‍යාපාරවලට සම්බන්ධ වියහැකි ව්‍යාපාර සහ ආයෝජන අංශ මොනවාද?

**ටෙප්ලිට්ස් තානාපතිතුමිය:** එක්සත් ජනපදයේ ව්‍යාපාරික අංශය එ.ජ. රජයෙන් මෙහෙයවන්නක් නොවේ. ඔවුන් තමන්ගේ තීරණ ගන්නේ ව්‍යාපාරික අවස්ථා සහ ව්‍යාපාරික අවශ්‍යතා පදනම් කරගෙනයි. කොහොම නමුත්, මෙරට වැඩි වැඩියෙන් එ.ජ. ව්‍යාපාරවල ආයෝජන දකින්න මා කැමතියි. ව්‍යාපාර කටයුතු සඳහා ශ්‍රී ලංකාව සලකා බැලීමට එ.ජ. ව්‍යාපාර දිරිමත් කිරීමටත්, අපේ ව්‍යාපාරවල වාණිජ ලැදියාවන් වෙනුවෙන් කථා කිරීමටත් එ.ජ. තානාපති කාර්යාලය සෑහෙන වෙහෙස වී වැඩ කරමින් තිබෙනවා. එය අපගේ රාජකාරියේ කොටසක්. එය, ශ්‍රී ලංකාවෙන් පිහිටවූ තානාපති කාර්යාල ඇතුළුව ලොව වටා සියළු විදේශ තානාපති කාර්යාලවල රාජකාරියේ කොටසක් වෙනවා.

මින් ඇතැම් ක්ෂේත්‍රවල වඩාත් වැඩි විභවයක් තිබේය කියා මා සිතනවා. ඒවා, රාජපක්ෂ ජනාධිපතිතුමා විසින්ම මේ රජයේ ප්‍රමුඛතා වශයෙන් අවධාරණය කළ ක්ෂේත්‍රයි. තාක්ෂණ ක්ෂේත්‍රය, බලශක්ති ක්ෂේත්‍රය, සහ බලශක්ති ක්ෂේත්‍රය තුළ පුනර්ජනනීය බලශක්තිය මීට

ඇතුළත්. මේවා, එක්සත් ජනපදයේ ව්‍යාපාරවල ශක්තිමත් අංශ නිසා මේවා සම්බන්ධයෙන් විභවයක් තිබෙනවා.

කලින් ප්‍රශ්නයකදී ඔබ නිව් ෆෝට්‍රස් එනර්ජි සමාගම ගැන සඳහන් කළා. නිව් ෆෝට්‍රස් එනර්ජි සමාගම සහ රජය අතරේ මෑතකදී ඇතිකරගත් රාමු ගිවිසුමෙන් මා දිරිමත් වුවා. සුප්‍රකට ඇමරිකානු සමාගමක් ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයේ ආයෝජන කිරීමෙන් ගෝලීය ආයෝජක ප්‍රජාවට යවන්නේ ධනාත්මක පණිවුඩයක්. ශ්‍රී ලංකාවට සැබැවින්ම එවැනි ආයෝජන වැඩියෙන් ආකර්ෂණය කරගෙන මෙරට ව්‍යාපාර කිරීමට සුදුසු තැනක් යන්න පෙන්නුම් කළයුතුයි.

ප්‍රශනය: තානාපතිතුමියනි මේ ප්‍රශ්නය Quad සම්බන්ධයෙන්. Quad හා අදාළව එක්සත් ජනපදය ශ්‍රී ලංකාවෙන් අපේක්ෂා කරන්නේ මොනවාද?

**ටෙප්ලිට්ස් තානාපතිතුමිය:**මා හිතන්නේ අපි පියවරක් පසුපසට තබා Quad කියන්නේ කුමක්ද කියා බැලීම මේ සඳහා ප්‍රයෝජනවත් වේවි. Quad කියා කෙටියෙන් සඳහන් කරන්නේ Quadrilateral එහෙමනැතිනම් සිවුපාර්ශවීය යන වචනයයි. ඉන්දියාව, ජපානය, එක්සත් ජනපදය සහ ඔස්ට්‍රේලියාව යන රටවල් හතර ඒ සිවු පාර්ශවයන් වනවා. මුලින්ම Quad ඒකරාශී වුනේ 2004 සුනාමි උවදුරෙන් පසු ඊට ප්‍රතිචාර දැක්වීමට පවත්වූ රැස්වීමක් වශයෙන්. 2007 දී එය රාජතාන්ත්‍රික සංවාදයක් බවට පත් වුවා. ඉන් පසු 2017 දී එය වඩාත් පුළුල් සංවාදයක් වශයෙන් යළි ඉපදුනා කියන්න පුළුවන්. එනිසා මෙය අර්බුදයකට ප්‍රතිචාර දක්වන්නට කළ කැඳවුමක් ලෙස ඉපදී මේ වනවිට ඉන්දු-ශාන්තිකරය සඳහා පොදු දැක්මක් ඇති රටවල් හතරක රැස්කිරීමක් වී තිබෙනවා. පැහැදිලිවම ඒ දැක්ම නිදහස්, විවෘත, ප්‍රත්‍යස්ථ සහ සර්වග්‍රාහී අවකාශයක් සඳහා ඇති දැක්මක්. ලෝකයේ මේ අතිවිශාල කලාපය ප්‍රවේශවියහැකි, ගතික, ජාත්‍යන්තර නීතියෙන් පාලනය වන, සහ තරණයේ නිදහස හා ගැටුම් සාමකාමීව විසඳාගැනීම වැනි මූලික මූලධර්මවලින් පාලනය වන අවකාශයක් වන බව සහතික කරගන්නට අපට අවශ්‍යයි.

පැහැදිලිවම, රටවල්වලට බලකිරීමකට ලක් නොවී තමන්ගේම ප්‍රතිපත්ති තෝරාගන්නට හැකි බව සහතික කරගන්නට අපට අවශ්‍යයි.

ඉතින්, ඒ පසුබිම් කාරණා අවබෝධ කරගනිමින්, මේ කලාපයේ සියළුම රටවල් සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ බලාපොරොත්තුව වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම්, තරණයේ නිදහස වැනි නිදහස ඇතුළුව මූලික නිදහස සාක්ෂාත් කරගන්නේ කෙසේද, ඒවාගේම සර්වග්‍රාහී හා සමෘද්ධිමත් තත්වයට ළඟාවන්නා වූ යහපත්, සහ මනා පාලනයක් සහිත ආර්ථිකයක් ඇතිකරගන්නේ කෙසේද යනාදී කාරණා සම්බන්ධයෙන් අපේ පොදු වටිනාකම් වර්ධනය කරගැනීමයි. මා හිතන හැටියට අපගේ ද්විපාර්ශවීය සබඳතා තුළ සාක්ෂාත් කරගන්නට වැඩකරන අරමුණු හා මේවා අතර වෙනසක් නැහැ. මෙහිදී එක්සත් ජනපදය කියන්නේ මෙකී අරමුණු ප්‍රවර්ධනය කරන්නට බලාපොරොත්තුවන සිවුපාර්ශවීය සංවාදයක එක් පාර්ශවයක් පමණයි.

මේ අරමුණු, පොදුවේ ශ්‍රී ලංකාවත් බෙදාහදාගතයුතු අරමුණු වනවා. ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී රටක්, ඒවාගේම එය සමුද්‍රීය වෙළඳාමේ නිරත රටක්. ඉතින් මේ අරමුණු ප්‍රවර්ධනය කරන්නට අපට එක් වී වැඩකරන්නට හැකිවේ යැයි අපි බලාපොරොතු වෙනවා.

**ප්‍රශ්නය:** ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය නොබැඳි ප්‍රතිපත්තියක් බවත් එය මධ්‍යස්ථ බවත් ශ්‍රී ලංකා රජය යළි යළිත් ප්‍රකාශ කර තිබෙනවා. මෙම ස්ථාවරය එක්සත් ජනපදයට කොතරම් දුරකට පිළිගතහැකිද?

**ටෙප්ලිට්ස් තානාපතිතුමිය:** ශ්‍රී ලංකාව ස්වෛරී රාජ්‍යයක්, අනෙක් රටවල් සමගින් ඇති සම්බන්ධතා කළමනාකරණය කරගන්නේ කෙසේද කියා තීරණය කළයුතු ශ්‍රී ලාංකිය ජනතාවයි. අප සැමවිටම පලකළ අදහස වන්නේ ශ්‍රී ලංකාවට, සහ වෙනත් ඕනෑම රටකට තමන්ගේ සම්බන්ධතා විවෘතව, විනිවිදභාවයෙන් යුතුව සහ අන්‍යෝන්‍යවශයෙන් ප්‍රතිලාභ ගෙනදෙන අන්දමින් පවත්වාගෙන යාමට හැකිවේවා යන බලාපොරොත්තුවයි. එක්සත් ජනපදයට ශ්‍රී ලංකාව සමගින් ඇත්තේ එවැනි සම්බන්ධතාවයක් කියා අපි විශ්වාස කරනවා. ඊටත් වඩා, අපට ඇත්තේ හවුල්කාරීත්වයක් කියා අප සිතනවා, හවුල්කාරීත්වයක් කියන්නේ දෙපසටම ක්‍රියාත්මක වන සම්බන්ධතාවයක්. එවැනි සම්බන්ධතාවයක් තුළ අවංකව අදහස් බෙදාහදාගැනීමට, අපේ වටිනාකම් හා ලැදියාවන් වටා සහයෝගීතාවය වර්ධනය කරගැනීමට සහ අන්‍යෝන්‍ය වශයෙන් උදවු කරගන්නට පවා හැකියි කියා මා සිතනවා. අපේ මේ සම්බන්ධතාවය වසර 70කට වැඩි කාලයක් තිස්සේ පවතිනවා. ඒ කාලයෙන් වසර 60 තිස්සේ අපි ශ්‍රී ලංකාවට සංවර්ධන ආධාර ලබාදෙමින් කෘෂිකර්මය, අධ්‍යාපනය, සෞඛ්‍යය යනාදී ක්ෂේත්‍රවල සිට නිවාස, ජල සනීපාරක්ෂාව, පරිසරය, ක්ෂුද්‍ර ව්‍යාපාර යනාදිය දක්වා ඇත්තෙන්ම සෑම ක්ෂේත්‍රයකම සහය ලබාදී තිබෙනවා. ඔබ ඕනෑම ක්ෂේත්‍රයක් නම් කළොත්, ඒ ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාව රියැදුරු අසුනේ තබමින් මෙරට ජනතාවගේ ජීවිත ඉහළට ඔසවා තබන්නට, ප්‍රජාවන් ගොඩනගන්නට සහ ස්වයංපෝෂිතභාවය ළඟා කරගන්නට අප සහය ලබා දෙමින් ඔබ සමගින් සිට ඇති බව මට කියන්නට පුළුවන් වේවි.

එනිසා, ගනුදෙනුවකින් එහාට ගිය සම්බන්දතාවයක්, එනම්, සැබෑ හවුල්කාරීත්වයක් සඳහා අප බෙහෙවින් කැපවී සිටිනවා. අපේ ද්විපාර්ශවීය බැඳීම් අප දකින්නේ මේ ආකාරයටයි.

**ප්‍රශ්නය:** ශ්‍රී ලංකා-එක්සත් ජනපද සම්බන්ධතාවය ගැන කථාකරනවිට, එය විවිධ පැතිකඩ සහිත සම්බන්ධතාවයක්. ඒ සියල්ල සමස්ථයක් ලෙස ගත් කල මේ සම්බන්ධතාවයේ තත්ත්වය සහ මේ විවිධ පැතිකඩ අතරේ අන්තර්සබඳතා කෙබඳුද?

**ටෙප්ලිට්ස් තානාපතිතුමිය:** පාලනය, ආර්ථික වර්ධනය, සර්වග්‍රාහී ආර්ථික වර්ධනය හා ආරක්ෂක සහයෝගීතාවය, ඒවාගේම මුහුදු මාර්ග ආරක්ෂා කිරීම හා සර්වග්‍රාහී ආර්ථික කලාප හෝ ආපදා ප්‍රතිචාර සඳහා හැකියාව ඇතිකිරීම වැනි පැතිකඩ තිබෙනවා. මේ සියල්ලම එකිනෙක අතරේ අන්තර්සබඳතා සහිත ලැදියාවන්. එක්සත් ජනපදයට ඉන්දු ශාන්තිකර කලාපය සඳහා පුළුල් ලැදියාවන් සමූහයක් තිබෙනවා. සමුද්‍ර තරණය සඳහා ඇති නිදහස වැනි මූලධර්ම හා වටිනාකම් පිළිබඳ කථාකරමින් ඉහත මා ඒවායින් ඇතැම් කරුණු සඳහන් කළා ඔබට මතක ඇති. ඒ සියල්ල අපේ ආරක්ෂක සහයෝගීතාවය සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සඳහා (නොපැහැදිලිය) සම්බන්ධ වනවා.

එනිසා මා මේවා අන්තර්සම්බන්ධතා සහිත පැතිකඩ කියා මා සිතනවා. ප්‍රජාතන්ත්‍රවාදී රටවල් හැටියට එක්සත් ජනපදයත් ශ්‍රී ලංකාවත් පැහැදිලිවම පොදු අරමුණු බෙදාහදාගත යුතුයි. යහපාලනය, නීතියේ ආධිපත්‍ය සහ ආර්ථික වර්ධනය දිරිගන්වන්නට අපට එක්වී වැඩ කළ

හැකියි. සියළුම පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කෙරෙන බව සහතික කරගැනීමටත්, ශ්‍රී ලංකාවේ සමෘද්ධිමත්භාවය සහතික කිරීමට හා දිරිමත් කිරීමටත්, මෙරට ස්වෛරීභාවය ආරක්ෂා කිරීමටත් පැහැදිලිවම අපි රාජපක්ෂ ජනාධිපතිතුමා සහ රජය සමගින් ඉදිරියටත් සම්බන්ධ වෙමින් කටයුතු කරනවා.

ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණුවලට කැපවී සිටිනවා. ඒවා හරහාත් මෙම පුළුල් ගැටළු පරාසය ආවරණය වන බව සඳහන් කරන අතර, එහිදී වැදගත්ම කරුණක් වෙන්නේ ඉන් එක් අරමුණක් සම්බන්ධයෙන් පමණක් වැඩ කරන්නට අපහසුයි, ඒවා සියල්ල ඔබ සඳහන් කළාක් මෙන් එකිනෙක සම්බන්ධ වී ඇති නිසා ඒ සෑම එකක් සම්බන්ධයෙන්ම වැඩ කරන්නට අවශ්‍යයි.

**ප්‍රශ්නය:** මූල්‍ය ආධාර හා සහයෝගීතාවය සඳහා ශ්‍රී ලංකාව චීනය මත දැඩි සේ යැපීම පිළිබඳව ඇතැම් අය සැලකිල්ල යොමුවියයුතු බව කියනවා. ශ්‍රී ලංකාව මූල්‍ය අර්බුදයකට මුහුණ දී සිටින වත්මන් පසුබිම තුළ එක්සත් ජනපදයට ශ්‍රී ලංකාව වෙත උදවු කළ හැක්කේ කුමන ආකාරයටද?

**ටෙප්ලිට්ස් තානාපතිතුමිය:** එක්සත් ජනපදයෙන් ලැබෙන අධාර ආපසු ගෙවියයුතු නැහැ. ඇත්තෙන්ම අපි ණය ලබාදෙන්නේ නැහැ. තමන්ගේ ශක්තියෙන් නැගී සිටීම සඳහා ශ්‍රී ලාංකිකයින්ට උදවු කිරීමටත් ශ්‍රී ලංකාවට වැඩියෙන්ම අවශ්‍ය වී තිබෙන අංශ ගණනාවක් තුළ ධාරිතාවය සහ ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැංවීමටත් අප සූදානම්. එමෙන්ම, ගත වූ 70 වසරක් තිස්සේ ශ්‍රී ලංකාවේ ආර්ථික විභවය වෙනුවෙන් අප දීර්ඝ කාලීනව කැපවී වැඩ කර තිබෙනවා, ඉන් සැබෑ ප්‍රතිඵල ලබා තිබෙනවා. කොටස් වෙළඳපල, (නොපැහැදිලිය) සහාව- මේවා, එක්සත් ජනපදයේ අනුග්‍රාහකත්වයෙන් සිදුකළ සංවර්ධන ආධාර වැයම්වල ප්‍රතිඵල වනවා. රැකියා පුහුණු ද විශාල ප්‍රමාණයක් සිදුකර තිබෙනවා. මේ අවස්ථාවේදී අපේ අවධානය යොමු වී ඇත්තේ ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සංවර්ධනයටයි. ශ්‍රී ලංකාවේ ආර්ථිකයට තවතවත් හානි වියහැකිව තිබූ හදිසි අවස්ථාවලදී අප ප්‍රතිචාර දක්වා තිබෙනවා. ඔබ කලින් 2004 සුනාමි උවදුර ගැන කථා කළා, ඒවාගේම 2017 ගංවතුර, සහ වර්තමානයේ වසංගතය මීට ඇතුළත්.

මෑතකදී අපි ශ්‍රී ලංකාවට කිසිදු වියදමක් දරන්නට නොයෙදෙන ලෙස මොඩර්නා එන්නත් මිලියන 1.5ක් ලබාදුන්නා. මේ එන්නත් රැගෙන ආවේ කෝවැක්ස් පහසුකම යටතේයි, නමුත් ඒවා  සැපයුවේ එක්සත් ජනපදයේ එන්නත් සංචිතයෙන්. මෙය, නොකඩවා පවත්වාගෙන යන අපගේ කැපවීමේ කොටසක් වනවා.

ඊට අමතරව සෘජුවම කෝවිඩ් ආමන්ත්‍රණය කිරීමට හෝ ඉදිරියට ඉන් ආර්ථිකය මත ඇතිවන බලපෑමේ හානි අඩුකරගැනීමට සහය දෙමින් ඩොලර් මිලියන 8ක් අප ලබාදී තිබෙනවා. තවද, ජංගම වෙන්ටිලේටර් යන්ත්‍ර 200ක්, සහ කඩිනම් රෝග විනිශ්චය කට්ටල 500,000කට වැඩි සංඛ්‍යාවක් යනාදී ද්‍රව්‍යමය පරිත්‍යාග ද සිදුකර තිබෙනවා.

අපේ ප්‍රවේශය වී ඇත්තේ ආර්ථිකය වර්ධනය කිරීමට පමණක් නොව වසංගතයක් වශයෙන් වර්තමානයේ අප මුහුණදෙන මේ අර්බුදය ඇතුළුව විවිධ අර්බුද කළමනාකරණය සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට හැකිවන ලෙස ධාරිතා වර්ධනය කිරීමෙන් ශ්‍රී ලාංකිකයින්ට අවශ්‍ය මූලික සහය ලබාදීමයි.

**ප්‍රශ්නය:** මෑතකදී ඔබ බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා හමුවුවා. එහිදී සාකච්ඡා කළ කරුණු පදනම් කරගෙන මේ වනවිට ප්‍රායෝගිකව ලබා තිබෙන ප්‍රගතිය මොන ආකාරයේද?

**ටෙප්ලිට්ස් තානාපතිතුමිය:** මුදල් ඇමතිතුමා සමගින් අපි ඉතාමත් හොඳ රැස්වීමක් පැවැත්වුවා. එය ඉතාමත් මිත්‍රශීලී හමුවක්. අද අපේ මෙම සාකච්ඡාව තුළ වැඩියෙන් කථාබහට ලක් වුනු මාතෘකාවක් වන ආයෝජන ගැන කථා කරන්නට අපට එහිදී අවස්ථාව ලැබුනා.
ආයෝජකයින්ට මුහුණ දෙන්නට වී ඇති ඇතැම් අභියෝග, සීමාකිරීම්, සහ විවෘතවූත් විනිවිදභාවයෙන් යුක්ත වූත් පරිසරයක අවශ්‍යතාවය, ඒවාගේම, ආයෝජකයින් අවදානම්වලට නිරාවරණය කිරීම සීමා කිරීමත්, යහපරිච සහ උසස් ජාත්‍යන්තර සම්මතයන්ට අනුකූල වන සේ ශ්‍රී ලංකාව තම ව්‍යාපාර පරිසරය සකසාගැනීම පිළිබඳ ඇති බලාපොරොත්තුසහගතබව ගැන අපි කථා කළා.

ශ්‍රී ලංකාවට උසස් තත්වයේ ආයෝජකයින් ආකර්ෂණය වනු දකින්නට මා කැමතියි, මාගේ ඒ අදහස මා මුදල් ඇමතිතුමාට ප්‍රකාශ කළා.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය සම්බන්ධයෙන් සැලකියයුතු කාරණා වශයෙන් මා ප්‍රසිද්ධියේ සඳහන් කළ කරුණු පිළිබඳවත් මා ඇමතිතුමා සමගින් සඳහන් කළා. ශ්‍රී ලංකාවේ ආර්ථිකය මේ අවස්ථාවේ පවතින්නේ සෞඛ්‍යමත්බව අතින් උසස්ම මට්ටමක නොවේ. වසංගතය නිසා මෙය ගෝලීය වශයෙන් දුෂ්කර කාලයක් වී තිබෙනවා, ඒවාගේම, ශ්‍රී ලංකාවට මේ සම්බන්ධයෙන් ඇති විසඳුමේ එක් කොටසක් වන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන්, නොහොත් අයි එම් එෆ් විසින් ඉදිරිපත් කෙරෙන සම්පත් උපයෝගී කරගැනීමයි.

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජික රටක්. ශ්‍රී ලංකාවත් තවත් රටවල් 188කුත් මෙම අයිඑම්එෆ් හි සාමාජිකත්වය දරනවා. එය ඇති කරනු ලැබුවේ දරිද්‍රතාවයට එරෙහිව සටන් කරන්නට පමණක් නොව ගෝලීය වශයෙන් මූල්‍ය ස්ථායිතාවය සහතික කිරීම සහ ගෝලීය සේවා නියුක්ති අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට සහය ලබාදීමටයි. එනිසා, මේ අවස්ථාවේ ශ්‍රී ලංකාවට වුවමනා කරන්නේ හරියටම මෙවැනි වර්ගයේ මෙවලමක් කියා මා සිතනවා.

ඉතින් අප ඒ පිළිබඳ සංවාදයක නිරත වූවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජික රටක් වශයෙන් ශ්‍රී ලංකාවට එහි සම්පත් භාවිතා කර රටේ ආර්ථික කාර්යසාධනය ඇගැයුම් කර, ඉදිරියේදී වඩාත් ස්ථාවර ආර්ථික අඩිතාලමක් ගොඩනගා ගැනීමට මගපාදන වෙනස්කම් සිදුකරන ආකාරය පිළිබඳව බැලීමට යොදාගත හැකි මෙවලම් යොදාගන්නා මෙන් මා තවදුරටත් ශ්‍රී ලංකා රජය දිරිගන්වනවා.

**ප්‍රශ්නය:** අවසාන වශයෙන් මා ඇෆ්ඝනිස්තානයේ සිදුවෙමින් පවතින දෑ සම්බන්ධයෙන් ඔබෙන් අසන්නට කැමතියි. දශක දෙකකට පසුව එක්සත් ජනපදය ඇෆ්ඝනිස්ථානයෙන් ඉවත්වෙමින් සිටිනවා. කලාපීය සාමය සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ මීළඟ භූමිකාව කුමක් වේවිද?

**ටෙප්ලිට්ස් තානාපතිතුමිය:** තවත් බොහෝදෙනෙක් මෙන් මා ද මෙම සිදුවීම් සිද්ධවන ආකාරය දෙස බලා සිටියා. ඇෆ්ඝනිස්ථානයෙන් වාර්තාවන රූපරාමු ඉතාමත් සිත් කරදරයට පත්කරනසුළුයි. මේ වනවිට ගුවන්තොටුපලේ තත්වය ස්ථාවර වී ඇති බවත් පුද්ගලයින්ව රටින් ඉවත් කරගැනීම සිදුවෙමින් පවතිනබවත් දැනගන්නට ලැබුනා. අප ඇෆ්ඝනිස්තානයේ

අසල්වාසී රටවල් සහ කලාපයේ අනෙකුත් රටවල් ද, පොදුවේ ජාත්‍යන්තර ප්‍රජාව ද සමගින් සම්බන්ධීකරණය කරමින් සිටිනවා.

එහි ඇතිවෙමින් පවතින තත්වය සම්බන්ධයෙන් එකිනෙක සමගින් නිසි ලෙස පෙළගැසුනු ප්‍රවේශයක් යොදාගන්නා බව සහතික කරගන්නට අපට අවශ්‍යයි. දැනට දිනකට හෝ දින දෙකකට පෙර මේ සම්බන්ධයෙන් නිකුත් කර තිබූ ප්‍රකාශයත් සමගින් එම වෑයමේ ප්‍රතිඵල අපට දැකගන්නට හැකිවී තිබෙන බවක් මට සිතෙනවා. මා හිතන්නේ මේ වනවිට රටවල් 106ක් මීට සම්බන්ධ වෙමින්, විදේශිකයින්ට සහ රටින් පිටවෙන්නට කැමති ඇෆ්ගනිස්තාන ජාතිකයින්ට සුරක්ෂිතව සහ සාමකාමීව රටින් පිටත්වීම සඳහා පහසුකම් සලසන මෙන් අදාළ පාර්ශවයන්ගෙන් ඉල්ලා තිබෙනවා.

සියළුම එදිරිවාදිකම් නවත්වන මෙන් සහ සර්වග්‍රාහී සම්මුති සාකච්ඡා හරහා නව රජයක් පිහිටුවන මෙන් කියා සිටින ප්‍රකාශයක් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයත් නිකුත් කර තිබුණා. මා හිතන විදියට නොපමාව ගතයුතු මීළඟ පියවර වන්නේ මේවායි. මේ අවස්ථාවේදී අතිශයින්ම දුෂ්කර බවක් පැහැදිලිව පෙනෙන තත්වයක් හරහා අපට වැඩකරන්නට සිදුවෙනවා, නමුත් අප මෙය කලාපය තුළ සහ පොදුවේ ජාත්‍යන්තර ප්‍රජාව සමගින් සහයෝගයෙන් කළයුතුයි.

**ප්‍රශ්නය:** මේ පිළිබඳව ඔබ ශ්‍රී ලංකා රජය සමගින් සම්බන්ධ වූවාද?

**ටෙප්ලිට්ස් තානාපතිතුමිය:** ඔව්, අපේ අදහස් සහ අප සැලකිල්ල යොමුකළ කරුණු පිළිබඳ බෙදාහදාගැනීමට අපි සංවාද පැවැත්වූවා. ශ්‍රී ලංකාවත් දැනට සිදුකෙරෙන ගෝලීය සංවාදයේ කොටස්කරුවන් වේවි.

**ප්‍රශ්නය:** තානාපතිතුමියනි, මේ සාකච්ඡාවට කාලය ලබාදීම ගැන ඔබට බොහෝම ස්තුතියි. නැවතත් ඔබ හමුවන්නට ලැබේවි යැයි බලාපොරොත්තු වෙනවා.

**ටෙප්ලිට්ස් තානාපතිතුමිය:**ස්තුතියි කැලුම්, මේ අවස්ථාව මා අගය කරනවා.

# # # #